# මහබෝසත් සිරිතක
# පියසටහන්



**නා උයනේ අරියධම්ම අනුනායක නා හිමියන්**



**සටහන,**
මීරිගම, බෝතලේ කිණිතුලාගල ආරණ්‍යසේනාසනාධිපති
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති, ත්‍රිපිටකාචාර්ය
**පූජ්‍ය තල්ගමුවේ සුධීරානන්ද ස්වාමීන් වහන්සේ**


**මුද්‍රණය**

**දිමුතු මුද්‍රණාලය**

**අංක 103/A, නුවර පාර, යක්කල.**
**දුරඃ 033-2239662 / 077-8829705**
**විද්‍යුත් තැපෑලඃ** dimuthupub@yahoo.com
**දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.**
**වෙබ්ඃ** www.dhammadanabooks.com

# යථාර්ථය.....

"නිග්ගණ්හේ නිග්ගණ්හාරහං
පග්ගණ්හේ පග්ගණ්හාරහං"

මෙම ශුද්ධ බුද්ධ වචනයෙන් කියවෙන්නෙ නින්දා කළ යුතු තැනදී නින්දා කළ යුතු බවත් ප්‍රශංසා කළ යුතු තැනදී ප්‍රශංසා කළ යුතු බවත්ය. නමුත් වත්මනෙහි මෙයට විරුද්ධව ක්‍රියාකරනුවෝ කොතෙකුත් දක්නට ලැබෙති. එය බුදු දහමේ නිර්වචනය කරන්නේ අගතිගාමී විම ලෙසය. මේ පුංචි පිටු කිහිපයකින් මා උත්සහ දරන්නේ අසීමිත සසුන් බරක් ඉසිලූ ශ්‍රේෂ්ඨ සංඝපිතෘන් වහන්සේ නමක මුල් කරගෙන ඉහත කී බුද්ධ වචනයට යම් සාධාරණයක් ඉෂ්ඨ සිද්ධ කිරීමටයි.

ඒ ශ්‍රේෂ්ඨ යතිවරයන් වහන්සේ අති පූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ වෙති, රටදය සමයේ පිනින් පහළ වූ මේ උත්තම මහා බෝධිසත්ව ජීවිතයට මා දරණ මේ අහිංසක උත්සහය මදි පුංචිකමක් වේදෝයි මා සිත ඇත්තේ කාංක්ෂාවකි. යම් කෙනෙකු පිළිබඳ තේරුම් කිරීමක් කළ යුත්තේ ඒ හා සමානව සිටින තවෙකෙකි. බුදුගුණ නිසිසේ වැනිය හැක්කේ තවත් බුදු කෙනෙකුට පමණි. එමෙන්ම අතිපූජනීය නා උයනේ නා සමිඳු ගැන කිව හැක්කේ ඒ තරමටම සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් මේරූ කෙනෙකු විසිනි. මා දරණ උත්සහය ඒ සඳහා සමහර විට මහ සයුරට වැටුනු සාවෙක් දිවි රැකුමට දරණ උත්සහය මෙන් විය හැකිය.

එහෙත් අප උගත් බණ පමණින් එය පමණ කොටගෙන අස්මදාචාර්යෝත්තම මාහිමියන්ට කෙරෙන ගුරු පූජාවක් සෙයින් මෙසේ අසාර්ථක උත්සහයක් විය හැකි වුවද කිරීමට සිතිමි.

මෙහි යම් පමා දොසක් වෙතොත් තමා නොකළ වරදකට මෙරමා කෝප නොවෙත්වා. මක් නිසාද වරද ඇත්තේ මා තුළ නිසාවෙනි.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ යෝගාශ්‍රමාධිපති කම්මට්ඨානාචාර්ය තදීය නිකායික අනුනායක, මහෝපාධ්‍යාය අප ගුරුදේවෝත්තම අතිපූජනීය නා උයනේ  මාහිමිපාණන් වහන්සේගේ ශ්‍රී නාමයට මාගේ මේ දුර්වල ප්‍රයත්නය ගුරු උපහාරයක්ම වේවා.

**තුන් ලොව සනාථ කෙරුමට මතුබුදු වේවා.**

මේයට,
රටදෑයසමයාභිවෘද්ධිකාමී,
තල්ගමුවේ සුධීරානන්‍දවම්භ.

# පුණ්ණානුමෝදනාව

## ඉච්චා අධිකාරේන - කතාය ශුද්ධ චේතසා
## අරියධම්ම මහාථේරෝ - පප්පොති අමතංපදං

අපවත් වී වදාල අතිපූජනීය නා උයනේ අරියධම්ම අනුනායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ තෙමස් පූර්ණ පිංකම් මාලාවට මීරිගම, බෝතලේ කිණිතුලාගල ආරණ්‍යසේනාධිපති රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිපිටකාචාර්ය පූජ්‍ය තල්ගමුවේ සුධීරානන්ද ස්වාමීන්වහන්සේ විසින් සටහන් කරන ලද ''මහබෝසත් සිරිතක - පිය සටහන්'' නමැති පොත් පිංච ධර්මදානයක් ලෙසින් නැවත මුද්‍රණය කිරීමට ලැබීම ගෞරවනීය අතිපූජනීය නාසමිඳුන්ගේ ශ්‍රේෂ්ඨ මහ බෝසත් චරිතයෙන් බිඳක් මේ අයුරින් සිහිපත් කරන්නට ලැබීම භාග්‍යක් කොට සලකමි.

ගෞරවනීය මාහිමිපාණන් වහන්සේගේ පුණ්‍යබලය තුන් ලොවටම ධර්මබලයක් වේවා. මෙම කුසලය උන්වහන්සේට පූජා උපහාරයක්ම වේවා. මෙම ධර්ම ආනිසංස කුසල බලයත්, අප සැමගේ සියලුම කුසල් බලයත් මාහිමිපාණන් වහන්සේට සමතිංසත් පාරමී සපුරා උතුම් ලොව්තුරා සම්බුද්ධත්වය සාක්ෂාත් වීම පිණිසම හේතු උපනිශ්‍රය වේවා. සාධු! සාධු!! සාධු!!!

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක අපවත් වී වදාල අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ජිනවංශාභිධාන ස්වාමීන් වහන්සේ, අතිපූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමභිධාන ස්වාමීන් වහන්සේ, ප්‍රධාන අපවත් වී වදාල සියලුම සංඝ පීතෘන් වහන්සේලාට පැතූ පරිදිම උතුම් නිවන් සුව අත්වේවා.

මෙම පොත් පිංච නැවත මුද්‍රණයට අවසර ලබාදුන් රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිපිටකාචාර්ය අතිපූජනීය තල්ගමුවේ සුධීරානන්ද ස්වාමීන් වහන්සේට නිදුක් නිරෝගී සුවපත් භාවය ලැබී දීර්ඝායුෂ ලැබේවා. සියලු සම්‍යක් ප්‍රාර්ථනා මුදුන්පත් වී පතන අධිගම ඤාණයකින් මගඵල නිවන් අවබෝධවීම පිණිසම මේ කුසලයත් හේතු උපනිශ්‍රය වේවා.!

විශේෂයෙන්ම මෙම පොත් පිංච මුද්‍රණයට අනුග්‍රහ දක්වමින් ආශිර්වාද ලබාදුන් නා උයන ආරණ්‍ය සේනාසනාධිකාරී, කම්මට්ඨානාචාර්ය, ගුරුදේවෝත්තම අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමිපාදෝත්තමයන් වහන්සේටද, පූජනීය හීනටිගල පඤ්ඤාරාම ස්වාමීන් වහන්සේටද නා උයන ආරණ්‍යවාසී අති පූජනීය මීගොඩ සංඝශෝභන ලොකු ස්වාමීන්වහන්සේගේ පටන්

ආරණ්‍යවාසී සියලුම මහ සඟ රුවනටද මෙම ධර්ම ආනිසංස කුසලයද හේතු උපනිශ්‍රය වීමෙන්. නිදුක් නිරෝගී සුවපත් භාවය අත්වී දීර්ඝායුෂ ලැබේවා. සම්බුද්ධ ශාසනය නගා සිටුවීම පිණිස තව තවත් ශක්තිය, ධෛර්යය, වීර්යය, ආරක්ෂාව, ආශීර්වාදය අභිවර්ධනය වේවා. උන්වහන්සේලා ප්‍රාර්ථනා කරන බෝධි ඥාණයකින් උතුම් වූ නිර්වාණ ධර්මය සුවසේම සාක්ෂාත් වේවා.

සියලුම සිල්මෑණියන් වහන්සේලාටත්, භාවනායෝගී සැමටත්, උපකාරක අනුග්‍රහ දැක්වූ වාරියපොල යසවතී ජයසිංහ මෑණියන්ටත්, මහනුවර විශේෂඥ වෛද්‍ය නිළධාරිනි ජයන්තා විජේසේකර මහත්මියටත්, මාතලේ වෛද්‍ය නිළධාරිනි ශ්‍යාමලි උපසේන මහත්මියටත්, වැලිගල්ලේ මොලගොඩ මෑණියන්ටත් ඇතුළු සියලු ඥාති හිතමිත්‍රාදීන් ඇතුළු සියලු ලෝ සතුන්ටත්, උපකාරක දේව මණ්ඩලයටත් ඔබ අප සැමට ගුණ ගරුක උතුමන් වහන්සේලා ඇසුරෙහි පාරමීදම් සපුරා පතන බෝධියකින් ධර්මාවබෝධය ලැබීම පිණිස මෙම කුසලයන් හේතු උපනිශ්‍රය වේවා. උතුම් නිවනින් සැනසීම ලබත්වා.

ඉතා ශෝභන ලෙස ඉතා කෙටිකාලයකදී උනන්දුවෙන්, ශාසන අනුග්‍රහයෙන් මුද්‍රණ කටයුතු ඉටුකර දුන් දිමුතු මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාගේ සියලු සම්‍යක් ප්‍රාර්ථනා ඉටුවේවා. උතුම් නිවනින් සැනසීම ලබත්වා.

සියලු සත්වයෝ නොපමාව අමා මහ නිවන්සුව අවබෝධ කර ගනිත්වා.

''සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා''
නිවන් දකින තුරු සත්පුරුෂ ආශ්‍රයම ලැබේවා.

සාධු! සාධු!! සාධු!!!

මෙයට,
සසුන්ගුණ පුරණ,
**මාතලේ උපනන්දා දසසිල්මාතාව.**

# නම : සමන්ත භද්‍රාය.!

සියලු දක්ෂතාවන්ගෙන්ම සර්වාකාරයෙන් පිරිපුන්වූවෝ සර්වඥ බුදුවරයෝමය. ඉන් මෙපිට සියලු දෙනාගේම දක්ෂතාවන් මෙන්ම අදක්ෂතාවන්ද ඇත බොහෝ දෙනෙකුට ඇත්තේ අදක්ෂතාවයන්ය. සියලු අදක්ෂතාවන්ට මුල් වන්නේ ලෝභ දෝස මෝහයොමය. යමෙකුගේ සන්තානයේ යම් දුරකට මෙකී ධර්මතාවන් අඩුවෙන් පවතීද හේ දක්ෂතාවන්, කුසලතාවන් දියුණු කරන්නෙකි.

බුදු දහමින් දක්ෂතාවන් දියුණු කිරීමටම මඟ කියයි. මක් නිසාද, රාග, දෝස, මෝහ දුරලීමට මග කියන බැවිනි. බුදුසසුනේ වැඩ පිළිවෙල මෙයයි. මේ දහමේ කෙනෙකුගේ දක්ෂකම්, අදක්ෂකම් මැණුමට ප්‍රාමාණිකත්වෙන් ගනු ලබන නිර්නායක මිනුම් දඬු දෙකකි. එනම් පුද්ගලයෙකු තුළ දියුණුවන ඉහත කී කුසල් මුල් තුන සහ අකුසල් මුල් තුනය. වෙනත් නම්බු නාම උපාධි ආදිය නොවේ. බොහෝවිට ලෝකයා සලකන උසස්කම් දහම හමුවේ පහත්කම් ප්‍රකාශවන ඒවාය. මක් නිසාද යත් රාග, දෝස, මෝහ ඇති කිරීමට, ඇති රාගදිය වර්ධනයට ඒවා හේතුවන හෙයිනි.

සම්බුදු දෙසුමට අනුව කෙනෙකුගේ උසස් බව තීරණය කරන මිනුම් දඬු දහමින්ම සොයා ගතයුතු අතර ඒ අනුවම ගිහි හෝ පැවිදි කෙනාගේ උතුම් බව තීරණය කළ යුතුය. අතිපූජනීය නා උයනේ අරියධම්ම අනුනායක මාහිමියෝ මෙකී මිණුම් දඬු ඇසුරින් මැන බලන කල්හි ඉතා උසස් තැනක් උසුලන්නෙක් වූහ. බුදුරජාණන් වහන්සේ සිව්පිරිසකට දුන් උපාධි පසුපස හඹා යන උතුමෙක් වෙති.

**''පියෝච, ගරුභාවනීයෝ - වත්තාච වචනක්ඛමෝ**
**ගම්භීරඤ්ච කථං කත්තා - නෝ චට්ඨානේ නියෝජයේ''**

(ථේරගාථා)

ලෝකයේ සියලු දෙනාගේම ප්‍රියභාවය ලබාගන්නට බුදුවරයෙකුටවත් නොහැක. එහෙත් සීලාදි ගුණ කරණ කොට ගෙන ප්‍රියභාවයක් යමෙකුගෙන් සැලසේ නම් වටින්නේ එයයි. 'ගරහාව සෙය්‍යෝ විඤ්ඤූතං යං චෙ බාලප්පසංසනා' වූ සෙයින් නැණවතාට ප්‍රියවීමටයි, අප උත්සහවත් විය යුත්තේ. අප ආචාර්ය නා උයනේ නාහිමිපාණෝ නැණවතුන්ගේ, ගුණවතුන්ගේ නොවක් ප්‍රශංසාවට බඳුන් වූහ. ඒ උන්වහන්සේ තුළ පැවති සීලාදී ගුණ නිසාවෙන් මැයි, මහාබෝධිසත් අප නා සමිඳු ශික්ෂා පද සීලය අකුරට රැකි උතුමෙකි. වරෙක තායිලන්ත සංචාරයකදී චෛත්‍ය ප්‍රදක්ෂිණාවක් කරගෙන යද්දී ඔබතුමාගේ ආකල්පයට සුපැහැදුණු විදේශ සැදැහැති පිරිසක් විශාල මුදල් පසුම්බියක් ඔබ දෙසට යොමු කළේ, නමුත් පසු පසින් උපාසක කිහිප දෙනෙකුම ආවත් කැප ලෙස ඔවුන්වත් එයට යොමු නොකර අප ඇදුරාණෝ නිර්දය ලෙස එය අත දිගු කර වහාම ප්‍රතික්ෂේප කළසේක. උන්වහන්සේ සාමනේර වයසේදී සිදු වූ සිද්ධියක් මෙසේය,

ඔබ කුටිය සමීපයේ නාන කාමරය ළඟ සුවඳ හමන සබන් කැටයක් තිබී ඇත. සම්භාවනීය ස්වාමීන් වහන්සේ නමක් අප සමිඳු සුවඳ සබන් පාවිච්චි කරතැයි සිතා දින ගණනක් කථා නොකර සිට පසු දිනක සුවඳ සබන් පාවිච්චිය 07 වන සික පදය බිඳීමටත් හේතු වන බවත්, ඔය නම එසේ කිරීම නොවටින බවත් අවවාද කළේලු. අප සමිඳු එවිට ඒ සබන්කැටය තමාගේ නොවන බවත්, තමා පාවිච්චි නොකරන බවක් කී කල්හි, එම සම්භාවනීය උතුමන් වහන්සේ අරියධම්ම ස්වාමීන් වහන්සේ කෙරෙහි පුදුම තරමේ සෙනෙහසක් ඇති කර ගත්තේලු. සමහර විටෙක අපි සුදු සිවුරක් පඬු පෙවීමට පෙර වෙළෙඳසැල්වල ඇති පඬු කුඩු මගින් සිවුරේ

පැහැය සකසා කැප වන ලෙසට පසුව නිසි පඬු ගසා ගන්නෙමු. උන්වහන්සේ කියන්නේ 'මගේ සිවුරුවලට නියම පඬු හැර කෘත්‍රිම කිසිවක් මිශ්‍ර කරන්න එපා' යනුවෙනි.

මෙලෙස අප ගුරු සමිඳු කුඩා අනුකුඩා කිසිදු සික පදයකුදු කඩන්න නොදුන්නා පමණක් නොව කිසිම තැනක, ස්ථානයක අධිපතිකම් ගැනවත් සිතා ස්ථාන සැකසුමටවත් සිතුයේ නැත. නිතරම උන්වහන්සේ පවසන්නේ, ''මගේ උපාධිය, මගේ සම්මානය, මගේ පැවිදි උපසම්පදාව බවයි. එය මම අකුරටම රකින බවයි.''

ඉන්ද්‍රිය සංවර සීලය උන්වහන්සේගේ අතිඋත්තමය. රහතුන් වහන්සේගේ ආකල්ප සම්පත්තියක්ම උන්වහන්සේට විය. උන්වහන්සේගේ ගමන, හිඳුම, සැතපීම, වටපිට බැලීම ඇත් රාජයෙකු වැනිය. අපි ගල්දූව ආරණ්‍යසේනාසනයේ ඉන්න කාලයේ උන්වහන්සේගේ පිණ්ඩපාත ගමන දැකීමට පුදුම තරමේ ආශාවකුයි දැක්වූයේ, ඒ උන්වහන්සේගේ අසාමාන්‍ය ඉන්ද්‍රිය සංවරය නිසයි. බොහෝ දෙනා උන්වහන්සේ රහතන් වහන්සේ නමකැයි සිතන්නට පුරුදු වූයේ මේ උත්තම ඉන්ද්‍රිය සංවර සීලය නිසා යැයි මට සිතේ. නමුත් සමිඳුන්ගෙන් සෘජුව යම් අය අසන විට උන්වහන්සේ පවසා ඇත්තේ ''මෑණියෝ එහෙම කෙනෙකු ගැන දුටු පමණින් එක්වරම විශ්වාස කරන්න එපා හිතන්න එපා'' යනාදී වශයෙනි.

එතුමන්ගේ ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලයද ඉතාම පිරිපුන්ය. උන්වහන්සේට අවුරුදු ගණන් සමීපචාරීව අපිත් වාසය කර ඇත්තෙමු. වතාවත් කර දී ඇත්තෙමු. නමුත් උන්වහන්සේ සිහියෙන් තොරව සිව්පස පරිභෝගයක් කරන වගක් අප දන නැත. කිසිම දිනක දන් වැළඳීමකදීවත් වටපිට බැලීමක් කරනු අප දැක නැත. කිසිකලෙකවත් මිච්ඡා ආජීවයෙන් ජීවත්ව නැත. අද කාලේ අපි රහත්හු වෙමු, බුදු වෙමු, ධ්‍යාන ලාභී වෙමු ආදී ලෙසින් ඒවා විකුණා ජීවත්වන පැවිද්දෝ පමණක් නොව ගිහියෝද සිටින

වකවානුවකි. මෙබඳු කලෙක අප සමිඳාණෝ සුපිරිසිදු ආජීව පාරිශුද්ධ සීලයෙන් පිරිපුන් උතුමෙක් වූහ.

මෙලෙස නාඋයනේ නාහිමිපාණෝ වෙන වෙන කරුණු නිසා නොව සුපිරිසිදු සීලයෙන්ම මිනිසුන්ට පමණක් නොව දෙවි බඹුන්ට පවා ප්‍රිය වූ බව නිසැකය.

මෙකී සතර සංවර සීලයෙන් යුක්ත වූ නිසාම නා උයනේ නාහිමිපාණෝ ඉතාමත් ගරුභාවනීය උතුමෙක් වූහ. සියම්, අමරපුර, රාමඤ්ඤ යන තුන් නිකායේම ගුණයට ගරු කරන, ගුණ දන්නා වූ සියලු යතිවරු උන්වහන්සේට ගරු කරති. පරමපූජනීය මඩිහේ මහා නායක අග්ගමහා පණ්ඩිත උතුමෝ වරෙක පොතක සටහන් තබන්නේ ලංකාවේ බොහෝ කර්මස්ථානාචාර්යන් වහන්සේලා සිටිති. ඒ සියලු දෙනා අතරින් අග්‍රගණ්‍ය භාවනා උපදේශකයන් වහන්සේ ලෙස මා සලකන්නේ නා උයනේ අරියධම්ම ස්ථවිරයන් වහන්සේයි' ලෙස සටහන් තබා ඇත. ස්‍යාමෝපාලි වංශික මහානිකායේ අස්ගිරි පාර්ශවයේ හිටපු පූජනීය මහානායක මාහිමිපාණන් වහන්සේ වන අග්ගමහා පණ්ඩිත උඩුගම ශ්‍රී බුද්ධ රක්ඛිත නාහිමිපාණෝ අප නා සමිඳුන්ගේ ගුරු දේවෝත්තම අතිපූජනීය කඩවැද්දුවේ ජිනවංශාභිධාන නා සමිඳුන්ගේ අපවත්වීම අළලා සංවේගය පළකරමින් පවසා තිබුණේ 'නා උයනේ ස්ථවිරයන් වැනි යතිවරයන් බිහි කිරීම බුදු සසුනට මහත් ලාභයක් වන බවයි.'

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායනු බද්ධව ආරම්භ වූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාව අද ආරණ්‍යසේනාසන නැමති අතුපතර 250 පමණ විහිදුණු මහා වනස්පති වෘක්ෂයකි. මේ සංස්ථාව පිහිටුවා වදාළ රාජකීය පණ්ඩිත, මහෝපාධ්‍යාය, අතිපූජනීය කඩවැද්දුවේ ජිනවංශ මාහිමිපාණෝ නා උයනේ සමිඳුන්ගේ ආචාර්යන් වහන්සේ වෙති. උන් වහන්සේ බොහෝ වාරවල ප්‍රකාශ කරන්නේ 'මේ අරියධම්ම නමට මමත් වඳිනවා, අරියධම්ම කියන්නේ මේ යෝගාශ්‍රමයේ මිණි පහන. අපි බ්‍රහ්ම ලෝකෙන් අරියධම්මව ගෙන්වා ගත්තේ පණිවිඩ යවලා...' යනාදී ලෙස අසාමාන්‍ය ගෞරවයක් අප මාහිමියන් කෙරෙහි පතුරවමිනි.

සියල්ල කියලා 'අරියධම්ම... යනුවෙන් ඇඳලා තමයි' පණ්ඩිත ස්වාමීන් වහන්සේ ගුණ වැනුම හමාර කරන්නේ.

නාථගණ ආරණ්‍ය සෙනසුන්පතිව වැඩ සිටි පණ්ඩිත ස්වාමීන් වහන්සේගෙන් පසුව යෝගාශ්‍රමයේ වගකීම භාදීමට වැඩ සිටි අතිපූජනීය ගැටමාන්නේ විමලවංශ නාහිමිපාණෝ කඩවැද්දුවේ නාහිමියන්ට පෙර අපවත් වූහ. මහා පෞර්ෂයක් තිබුණු මහා පඬිවරයෙක් වූ එම නාහිමිපාණෝ එවක පවසන්නේ තමන්ගෙන් ධර්ම ශාස්ත්‍ර ඉගෙන ගන්න පැමිණෙන, එවක ළපටි භික්ෂුවක වූ අරියධම්ම ස්වාමීන් වහන්සේ ගැන 'මේ අරියධම්ම නම වඳින්න එනකොට අපෙත් හිස පාත්වෙනවා' යන ස්වභාවයේ වදන්ය. බලන්න පිංවත, ඔබ අපි වැඳපු පුදපු අද අපෙන් සදහටම සමු ගෙන යන අතිපූජනීය නා උයනේ අරියධම්ම නා හිමියන්ගේ අද්විතීය ගරුභාවනීයත්වය.

'වත්තා' නම් වූ අවවාද අනුශාසනා අපට කොපමණ අප නා සමිඳු දුන්නාද? මෙලක්දිව ගිහිපැවිදි අයට පමණක් නොව දේශදේශාන්තරවල පමණක් නොව දෙව්ලොව, බඹලොව දක්වා උන්වහන්සේගේ කන්කළු වූද, මිහිරි වූද, ගැඹුරු වූද, බ්‍රහ්මස්වරය විහිදුනා නොඅනුමානය උන්වහන්සේගේ හඬ කිසිම ස්වාමීන් වහන්සේ නමකගේවත්, ගිහියෙකුගේවත් තිබෙනු අප අසා නැත. ඒ හඬ, ඒ රිද්මය අනන්‍යසාධාරණ වූ උන්වහන්සේටම ආවේණික හඬකි. ඒ හඬින් මොන තරම් බණ කීවද, පිරිත් කීවද, කර්ම වාක්‍ය කීවද, කුලදරුවන් දහස් ගණන් පැවිදි කළාද, සමිඳ ඔබ මියැදුනේද, අපවත් වුණේද ඔබ වහන්සේගේ මිහිරි දහම් බෙර හඬ අප සිත් තුළ මේ වාතලය පුරා හිස් අහස් කුස පුරා නින්නාද දෙනු අපට ඇසෙත්ම ඇසට නැගෙන්නේ කඳුලකි. ඔබ වහන්සේ, නා සමිඳුනේ, ඔබ අපට අවවාද කළා, අනුශාසනා කළා, කළයුත්ත කියාදුන්නා, නොකළ යුත්ත කියා දුන්නා. ඔබවහන්සේගේ ඒ මහා ධර්ම දානමය පින මතුවට තුන්ලොවට බණ කියන්න පෙරහුරුවක්ම වේවා. ඔබ වහන්සේ මතු බුදුවේවා.!

පැවිද්දෙකු තුළ පිහිටිය යුතුම ගුණයකි, 'වචනක්ඛම' එනම්

ඉවසීම. නා උයනේ මාහිමියන්ගේ ජීවිතයටත් අටලෝ දහම ඉහළින්ම පැමිණියේය. උන්වහන්සේට ලාභ, යස, ප්‍රශංසා, සැප අසාමාන්‍ය ලෙස පැමිණි අතර ඒ නිසාම කඩවැද්දුවේ මාහිමියන්ගේ මූලිකත්වයෙන් සමාරම්භ වූ යෝගාශ්‍රමය මෙරට පමණක් නොව විදේශයන්හි පවා ප්‍රකට වන්නට විය. භික්ෂු මුළුව මෙන්ම සැදැහැති ගිහියෝද ලක්ෂ ගණන් ආකර්ෂණය විය. නා උයනේ මාහිමියන්ට අටලෝදහමේ යහ පැත්ත මෙන්ම අයහ පැත්තද ආ නමුත් බොහෝ අය ඒවා දන්නේ නැත. දිනක් උන්වහන්සේට සිහිනෙන් පෙනෙනවා විශාල කඩදාසියක පොල් ගෙඩි තරම් අකුරින් ලියා තිබෙන වක්‍යයක් 'කම්පා නොවන්න, කම්පා නොවන්න' පසුදා උදෑසනම ලිපියක් එනවා 'අභූත චෝදනාවලින් පිරුනු එකකි. එය තවත් වරෙක එක සැඩපරුෂ භික්ෂුවක්ම උන්වහන්සේ ඉදිරියට පැමිණ, තූ: බල්ලා උඹ බුදු වෙන්ඩද? යනුවෙන්ද නින්දා කර ඇත, තවත් දිනක වෙනත් භික්ෂුවකගේ අඩුපාඩුවකට අප නාහිමි අවවාද නොදුන්නේ යැයි කියා අශීලාචාර ගැහැණියක් උඹ, බුදු වෙයන්, මම චිඤ්චා මානවිකාව වෙලා එනවා. බලන්න පිංවත අපි හිතනවා අපටමයි කරදර නින්දා අපහාස කියලා.

එදා බුදුරජාණන් වහන්සේ වඩින මග මත්පැන් බොමින් යශෝදරාවගේ පියා බුදුරදුන්ට නින්දා අපහාස කළේ, සුන්දරිකාව නිසා ස්ත්‍රී දූෂණ චෝදනා ලැබුවේ, ඒවා කර්ම විපාක. අපේ මාහිමියන්ටත් ඒවාගේ අකුසල කර්ම විපාක පැමිණියා මාස එක හමාරක් අසාධ්‍යව වැඩසිටින්නා වූ සේක. ඒ සියල්ලක්ම ඉවසීමේ හැකියාව අපට වඩා සිය දහස් ගුණයෙන් නා උයනේ නාහිමිපාණන්ට තිබුණි.

කල්‍යාණමිත්‍රයා ශාසනය රකින්නා යනු බුද්ධ දේශනයයි. කල්‍යාණමිත්‍රයා සතු තවත් ගුණාංගයකි. ගැඹුරු ධර්මඥාණය සහ එය ලෝකයාට හිතසුව පිණිස බෙදා දීම අපගේ කල්‍යාණ මිත්‍ර උත්තම නා උයනේ මා හිමි දුර්ලභ ගණයේ ධර්මඥාණයකින් හෙබි උත්තමයෙකි. ධර්ම භාණ්ඩාගාරයකි. අපි උන්වහන්සේගෙන් සියගණන් අභිධර්ම ගැටලු අසා දැනගෙන ඇත්තෙමු. මෙවකට

අනන්‍යසාධාරණ අසාමාන්‍ය ධාරණ ශක්තියකින් හෙබි උතුමා එතුමෝමය. ධම්මසංගණිප්පකරණ වැනි පිටු තුන්සිය ගණනක් ඇති ග්‍රන්ථයක් දින 19කින් කටපාඩම් දී හමාර කළෝය. ඒ මහා වෙහෙසකින් නොව එක පැයක් බැගින් පාඩම් කිරීමෙන්ය. මෙවන් ධාරණ ශක්තියක් බොහෝ විට පිහිටන්නේ සමීප අතීත භවවල බ්‍රහ්මලෝකවල වාසය කොට පැමිණි උතුමන්ටය. අපගේ උපාධ්‍යාය කඩවැද්දුවේ මා හිමිපාණන් වහන්සේ වෙතට අප නාහිමි සිසුවෙක්ව සිටි අවදියේ කට පාඩම් දීමට ගිය විට දැන් ඇති. ඇති නම කියන්නේ කඩවැද්දුවේ මාහිමිපාණෝය. ඒ තරමටම නා උයනේ නා සමිඳුන්ට ධර්මය පිළිබඳ ධාරණ ශක්තියක් විය. උන් වහන්සේ වරක් පවසා සිටියේ තමන් වහන්සේට පොතේ පේළි ටික වරක් බැලුවම, ඒ සියල්ල ඇස් වසා ගත් පසුව අහසේ ඇන්දාක් මෙන් පෙනෙන බවයි. බලන්න උපනිශ්‍රය ශක්තියක මහිමය. අතිපූජනීය අරියධම්ම සමිඳුන්ගේ මෙන්ම අපගේ ගුරු ස්වාමීන්වහන්සේ නමක් වූ අතිපූජනීය මහකුඹුක්වැව උත්තරවංස මාහිමියෝ අපට උගන්වන වකවානුවේ පැවසුවේ ''නම අරියධම්ම අයුෂමතුන්ට උගන්වන්න දෙයක් නෑ. දෙවෙනි දවසේ එනකොට පළවෙනි දවසේ ඉගැන්වූ සියල්ල කටපාඩම්'' යනුවෙනි. බලන්න පින්වත, මෙවන් උත්තමයෙකුටයි අප අද මෙසේ අවසන් බුහුමන් දක්වන්නේ.

අප නා උයනේ නා සමිඳු බුද්ධාංකුර ජීවිතයක් බවට සංකේත කොතෙකුත් උන් වහන්සේගේ චරිතාපදානය තුළ පිළිබිඹු වේ. මොනම වේලාවකවත් කාලය අපතේ යවන වගක් අප දැක නැත. උන් වහන්සේගේ පා සම්බාහනාදියක් කරන විටක වුවත් කථාකරන්නේ ධර්මයක් මැයි. ගමනක් බිමනක් වැඩියත් නවගුණ වැල අතේම තබා සිතන්නේ බුදුගුණමය. එය කල්‍යාණ මිත්‍රයෙකුගේ ලක්ෂණයකි. එතුමෝ නිර්වාණ මාර්ගයේම නිරතුරු සිත තබාගැනීම උන්වහන්සේට සමීපවත්ම, ඇසුරු කිරීම වැඩිවත්ම සිදුවන්නේ ඇසුරු කරන්නාට වනුයේ ගෞරවය වැඩිවීමක්මය. ඒ උන්වහන්සේ නිරන්තරයෙන් සතෝසම්පජානකාරීවම සිටින බවත් අප එසේ නොවන බවත්

මනාව තේරුම් යෑම නිසාය.

මාහිමියන්ගේ ජීවිතයේ සමහර රසවත් තැන් අප සමග පවසා ඇත. දිනක් බාසුන්නැහැලා පිරිසක් ගල්දුව අරණ්‍යයේ ළිදක් කපමින් සිටින අතර යට තිබූ විශාල ගලක් ගෝනියක් වැන්නක දමා උඩ සිටින කිහිපදෙනෙකු විසින් උඩට අදින අවස්ථාවක්ලු. කෙසේ නමුත්, උඩ පිරිසට එය මගක් අදින විට උඩටම ගන්නට වෙර මදවීලු. ළිඳ තුළත් කිහිප දෙනෙකි. තරුණ නා උයනේ මාහිමිට භික්ෂු නමක් මේ කාරණය විගසින් ගොස් කීවේලු. නා උයනේ නාහිමි වහාම දුවවිත් දකුණු පය පෙරට තබා තද කොට එකවරම ඒ මහා ගල උඩට ගත්තේලු. එතුමන්ගේ කොන්දේ අමාරුව එතැන් සිටය. තවත් දිනක ගල්දූවේ ආරණයේ අපේ උත්තරවංස, සමිඳු ගුණානන්ද සමිඳු ආදි නා උයනේ සමිඳුන්ට වඩා ජ්‍යෙෂ්ඨ සඟ පිරිසක් අමනුෂ්‍ය රෝගාදියකට තෙලක් සිඳින වේලාවකි. මේ දිවා කාලයකි ගිනි අව්ව ඇති වේලාවකි. කන් අඩි පුපුරණ ගණනට අකුණු පුපුරයි. කවුරුත් භ්‍රාන්ත වී ඇත. තෙල් තාච්චිය හැලෙන්නට කරුණු යෙදෙයි. උත්තරවංස නාහිමි යෝජනාවක් කරයි. අරියධම්ම ආයුෂමතුන් ගෙන්නෙව්වා නම් හරි උන් වහන්සේගේ හිසට හෙනයක් වැටුනත් බය නැනේ'' කවුරුත් එයට කැමති වූහ. නාහිමි වැඩම කොට වම් අත මත දකුණත තබාගත්තා පැය ගණනක් එක දිගට ''යානීධ භූතානි.... යනුවෙන් පටන්ගෙන තෙළ සෑදීම අවසන දක්වාම රතන සූත්‍රය දේශනා කළා. පහසුවෙන් තෙල සිඳගත්තා කීවා.'' මේ කරුණ මට කීවේ පූජනීය උත්තරවංස නාහිමියෝ පස්සේ කාලේ මම නා උයනේ මාහිමියන්ගේ පා සම්බාහනයක් කරද්දී ඇසුවා ස්වාමීන් වහන්ස මේබන්දක් සිදු වුනාද යන වග නා සමිඳු පැවසුවේ එය එසේමයි යන වගයි. මේ වගේ සිද්ධි නා උයනේ අරියධම්ම මාහිමියන්ගේ චරිතයේ කොතෙකුත් ඇත. බොහෝ ස්වාමීන් වහන්සේලා කඨින පිංකම් ආදියට වැඩම කළ විට මහන්සියටත් එක්ක සාමාන්‍ය දෑ ගැන කථා කිරීම සාමාන්‍ය දෙයකි. නමුත් නා උයනේ නා සමිඳු සාමණේර කාලයේ සිටම කොහේ වැඩියත් අතිරේක කාලයක් යෙදුනොත් සක්මන් භාවනාවක හෝ යෙදී වාසයකරන බව අපේ

වැඩිහිටි ස්වාමීන් වහන්සේලාගෙන් මම අසා ඇත්තෙමි. බලන්න පිංවත මේ ජීවිතය මහා බෝසත් ජීවිතයක් නොවේ යැයි කාට කිව හැකිද?

වරෙක අපේ බුදුරජාණන් වහන්සේ වදාළේ
සුවච කීකරු වූද
ධර්ම විනය මැනවින් උගත් වූද
අවවාද සතුටින් පිළිගන්නා වූද
ධර්මකථික වූද
විනයධර වූද
මනාආකල්ප සම්පත්තියෙන් යුක්ත වූද පැවිද්ද දුර්ලභ බවයි.

බලන්න පිංවත මෙකී ගුණාංග සියල්ලෙන්ම සුපෝෂිත උතුමෙක් නේද ඔබේ අපේ ශ්‍රේෂ්ඨ කළ්‍යාණ මිත්‍රයන් වහන්සේ. මේ වගේ උතුමෙකු සමීපව ඇසුරු කිරීමට ලැබීම අපට මහත් භාග්‍යයක් සේ සලකා උන්වහන්සේගේ ප්‍රාර්ථනාව පරිදි ත්‍රිපිටකාධාරී වෙමින් ධ්‍යාන සමාධි සමාපත්ති අභිඥා විපස්සනා මාර්ග ඵල දක්වාම දියුණුවීමට උත්සාහ දැරීමම උන්වහන්සේට කරන උපහාරයයි. ගෞරවයයි, ප්‍රණාමයයි.

අසාමාන්‍ය සීල, සමාධි, පඤ්ඤා ධර්මඥාණ, භාවනා ඥාණයන්ගෙන් හෙබිව අපවත් වී වදාළ අසමදාචාර්යෝත්තම අතිපූජනීය නා උයනේ අරියධම්ම අනුනායක මාහිමියන් වහන්සේ තුන්ලොවට පිහිට වන්නට මතු බුදු වේවායි! ඉමහත් ගෞරවයෙන් යුතුව ප්‍රාර්ථනා කරමු.

සාධු! සාධු!! සාධු!!!

අපේ පැතුම.....

ධම්මේන නේනමතිසිද්ධ මුදාවිතේන
බුද්ධාදි වත්ථු ගත චිත්ත පසාදිතේන
ථෙරාසභෝ අරියධම්ම යතින්ද නාථො
සම්බෝධි ඤාණ මධිගච්ඡතූ සාධූ සාධූ

**අරිදම් නා සමිඳු වන්දනා කරන ගාථාව**

**නා සමිඳුන් පිළිබඳ නිර්ව්‍යාජ ප්‍රීඋදාන,**

01. ''ලංකාවෙන් පැමිණි භාවනා යෝගීන් අතරින් මා දන්නා සියලු භාවනා එපරිද්දෙන්ම ප්‍රගුණ කළ හැකි වූ එකම කෙනා නා උයනේ අරියධම්ම ස්ථිවිරයෝ පමණි.

(බුරුම රට මෝලමියන් නුවර පා අවුක් භාවනා මධ්‍යස්ථානාධිපති, අග්ගමහා පණ්ඩිත, අග්ගමහාකම්මට්ඨානාචාරිය අතිපූජනීය පා අවුක් සෙයාඩෝ මහා ස්වාමීන් වහන්සේ.)

02. ''ලංකාවේ මෙකල වාසයකරන කර්මස්ථානාචාර්යන් වහන්සේලා අතර මා අග්‍රගණ්‍ය කොට, සලකන්නේ නා උයනේ අරියධම්ම ස්ථිවිරයෝය.''

(ශ්‍රී ලංකා අමරපුර සමස්ත සංඝසභාවේ උත්තරීතර මහානායක අග්ගමහාපණ්ඩිත අතිපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණෝ)

03. '' මේ අරියධම්ම නම අපි බ්‍රහ්මලෝකයෙන් ගෙන්වා ගත්තේ ආරාධනා කරලා බුදු සසුන රකින්න, අරියධම්ම නමට මමත් වඳිනවා, අරියධම්ම මටත් ඉස්සර වෙන්න හදන්නේ, මේ යෝගාශ්‍රම සංස්ථාවේ මිණිපහන අරියධම්ම නම''

(ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහෝපාධපාය ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක යෝගාශ්‍රමාධිපති, රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දූවේ ජිනවංස මාහිමිපාණෝ)

04. ''මේ අරියධම්ම නම අපට වඳින්න පුදන්න එනකොට මේ නමට අපෙත් හිස පාත්වෙනවා.

(කුරුණෑගල මාස්පොත නාථගණ ආරණ්‍යසෙනසුන්පතිව වැඩසිටි ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමයේ සභාපති ධුරය හෙබවූ, රාජකීය පණ්ඩිත අතිපූජනීය ගැටමාන්නේ විමලවංස නාහිමිපාණෝ)

05. මාගේ ශාසනික ජීවිත කාලයේදී මා නෙතින් දුටු, ත්‍රිපිටකය විස්තර කරන්නට සමත් සැරියුත් තෙරණුවෝ අටුවා විස්තර කරනට සමත් බුද්ධ ඝෝෂ තෙරණුවෝ ටීකා විස්තර කරනට සමත් දිඹුලාගලින් පහළවූ ටීකාචාර්යන් වහන්සේ

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ධුරය හෙබවූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාධිපති මහෝපාධ්‍යාය, ත්‍රිපිටක වාගීෂ්වරාචරිය, මහා කම්මට්ඨානාචරිය පරම පූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ වෙති.

නා සමිඳුන්ට, නිවන් සුව අත්වේවා.

මීරිගම, මිණිඔළුව විද්‍යාවාස
පිරිවෙන්පති, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
අධිකරණ නායක, ශාස්ත්‍රපති, පණ්ඩිත
මකුලෑවේ විමල මහා ස්ථවිර.

06. ''නා උයනේ අරියධම්ම හාමුදුරුවෝ වගේ තව කෙනෙක් ලෝකයේ වෙන රටවල ඉන්නවද කියලා අපි දන්නේ නැති නමුත් ලංකාවේ නම් මේ හාමුදුරුවෝ වැනි කෙනෙක් තවත් නෑ''

කැලණියේ විශ්වවිද්‍යාලයේ පාලි අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජනීය නා බිරිත්තන් කඩවර ඤාණරතන නාහිමිපාණෝ)

07. ''සුපටිපන්නාදි සඟ ගුණයන්ට නිසි සාධාරණය එකැතින්ම ඉටු කළ, ඉතා ව්‍යක්ත වූ ද, ලෝක ප්‍රකට වූද, ලෝක පූජිත වූද, නිවන් මග පමණක් අනුගමනය කරන අනුගමනය කළ අසහාය ථෙරපාණන් කෙනෙකු ලෙසයි. මා අරියධම්ම හාමුදුරුවෝ හඳුන්වන්නේ
(ශ්‍රී ලංකා පාලි බෞද්ධ විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජනීය වෑගම පියරතන නාහිමි)

# නා උයන ආරණ්‍ය සේනාසනය

ඉතාමත් නිහඬ සුන්දර පරිසරයක පිහිටා ඇති නා උයන ආරණ්‍ය සේනාසනය අතිවිශාල බිම් ප්‍රමාණයක් පුරා පැතිර පවතී. භික්ෂුන් වහන්සේලා සහ උපාසක මහතුන් සඳහා නා උයන ආරණ්‍ය සේනාසනයද, දස සිල් මාතාවන් සහ උපාසිකාවන් සඳහා ධම්මික ආශ්‍රමයද නේවාසිකව භාවනා කටයුතු කරගැනීමට ඔබ සැමට ඉඩ පහසුවද, එහිදී ඉතාමත් නිවැරදි මාර්ගෝපදේශයද නොඅඩුව ලැබෙනු ඇත.

නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ වර්තමානයේ ආරණ්‍ය සේනාසනයේ මුලසුන හොබවයි. උන්වහන්සේ බුදුන් දෙසූ ධර්මය එලෙසින්ම ලොවට දේශනා කරමින් ශාසනික වශයෙන් ඉතාමත් අනගි සේවයක් සිදුකරමින් සිටී.

මිතුරනි, දහම් පොත පතෙහි දැනුම ද කැටුව මෙවන් ආරණ්‍ය සේනාසනයක ඇසුර ලබාගෙන අප බුදුපියාණන් වහන්සේ හෙළි කර දුන් නිවැරදි දහම් මගට අද අද ම පිවිසියහොත් නියත වශයෙන් ඊළඟ භවයේදී හෝ ධර්ම අවබෝධය පිණිස එම ඇසුර හේතුවෙනවා නිසැකය.

අප කල්‍යාණ මිතුරු කැළ මෛත්‍රී සිතින් සෙත් පතමින් ප්‍රාර්ථනා කරන්නේ ඔබ සැමට නා උයන ආරණ්‍ය සේනාසනය වැඳ පුදාගෙන දන් පින්කම් පමණක් සිදු කිරීමෙන් නොනැවතී ආරණ්‍ය ස්වාමීන් වහන්සේලාගේ නිවැරදි මාර්ගෝපදේශයද ලබාගෙන සම්බුදු පියාණන් වහන්සේ වදාළ චතුරාර්යා සත්‍ය අවබෝධය අග්‍ර අමා මහ නිවන් අවබෝධය පිණිස කටයුතු කෙරෙත්වා කියාය.

නා උයන ආරණ්‍ය සේනාසනය පිලිබඳ තොරතොරු සඳහා ඔබ සැමට අන්තර්ජාලය ඔස්සේද පිවිසිය හැකිය.

http://www.nauyana.org/

පටිගත කරනලද ධර්මදේශනා අන්තර්ජාලය ඔස්සෙ ලබාගැනීම සඳහා සම්බන්ධ වන්න

071-5186770 nauyanainfo@gmail.com